

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

2023

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

சமுதாயஞ்சார் சீர்திருத்தத் திணைக்களம்

**Department of Community Based Corrections**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2023

## ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
## சமுதாயஞ்சார் சீர்திருத்தத் திணைக்களம்
## Department of Community Based Corrections


15 වැනි මහල
"මෙහෙවර පියස"
නාරාහේන්පිට
කොළඹ-05

15 ஆவது மாடி
"மெஹெவர பியெஸ"
நாராஹேன்பிட்டி
கொழும்பு- 05

15th floor
"Mehewara Piyasa"
Narahenpita
Colombo- 05

011-2683691
www.dcbc.gov.lk
dcbcorrection@gmail.com

**කොමසාරිස්තුමාගේ පණිවිඩය**



වරදින් මිදුණු යහපත් පුද්ගලයෙකු බිහිකිරීම සිය දැක්ම කරගත් ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව 1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත මගින් ස්ථාපනය කරන ලද රාජ්‍ය ආයතනයකි.

2023 වර්ෂය තුළදී ආඥාලාභීන් 14,026ක් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය සඳහා අධිකරණය මගින් යොමු කර ඇත. ඊට අමතරව ජනාධිපති සමාව යටතේද විශේෂ දිනයන්හිදි පුනරුත්ථාපනලාභීන් 1,910ක සංඛ්‍යාවක් දෙපාර්තමේන්තුව වෙත යොමු කෙරිණි. බන්ධනාගාර තදබදයට විකල්පයක් ලෙස ස්ථාපනය කරන ලද මෙම දෙපාර්තමේන්තුව වෙත අධිකරණ මගින් යොමු කරන ලද වරදකරුවන්ගෙන් කඩකිරීම් 11%ක් පවත්වාගනිමින් අදාළ නියෝග කාල සීමාව තුළ ඔවුන් වෙනත් වරදක් සිදුකිරීමෙන් වළක්වා ගැනීමට අපගේ නිලධාරීන් සමත්ව ඇත. මෙයට අමතරව 2023 වර්ෂයේ ආඥා සම්පූර්ණ කරන ලද තැනැත්තන්ගෙන් 39.7%ක් සාර්ථක ලෙස විශෝධනය කර සමාජගත කර ඇත. තවද, පහත කරුණු විශේෂයෙන් සඳහන් කිරීම සුදුසුයැයි හැඟේ.

- අධිකරණය මගින් ලැබී ඇති නියෝග අනුව ආඥාලාභීන්ගෙන් 73.5%ක ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් වන අතර ඔවුන් විශෝධනය කිරීම සඳහා තනි පුද්ගල හා සමූහ උපදේශනය, අධ්‍යාත්මික සංවර්ධන, මත් නිවාරණ උපදේශන හා ප්‍රතිකාර, වෘත්තීය පුහුණු යනාදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය සම්බන්ධ බොහෝ පිරිසක් යහපත් පුද්ගලයින් ලෙස සමාජගත කිරීමට හැකියාව ලැබී ඇත.
- ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කිරීම හා ඒ සඳහා වූ නව ප්‍රවණතා කෙරෙහි අවධානය යොමු කර ඇත.
- ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පර්යේෂණ අංශයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කිරීමට මේ වන විට කටයුතු කර ඇති අතර විශ්වවිද්‍යාල හා වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත.
- ප්‍රජා විශෝධන ක්‍රියාවලිය හා සම්බන්ධ ප්‍රජා විශෝධන නිලධාරි, සංවර්ධන නිලධාරි (ප්‍රජා විශෝධන) වැඩ පරීක්ෂක යන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතියි.
- තවද දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන වරදකරුවන් පිළිබඳව නිවැරදිව දත්ත තබා ගැනීම හා කළමනාකරණය කරගැනීමේ අරමුණින් වරදකරුවන්ගේ තොරතුරු කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීමේ කටයුතුද ආරම්භ කර ඇත.



දිලාන් ගුණරත්න
කොමසාරිස්
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

**2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

**ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව**

**වැය ශීර්ෂ අංකය 326**

**අන්තර්ගතය**


| | | |
|---|---|---|
| **පරිච්ඡේදය 01** | **-** | **ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය** |
| **පරිච්ඡේදය 02** | **-** | **ප්‍රගතිය හා ඉදිරි දැක්ම** |
| **පරිච්ඡේදය 03** | **-** | **වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය** |
| **පරිච්ඡේදය 04** | **-** | **කාර්ය සාධන දර්ශක** |
| **පරිච්ඡේදය 05** | **-** | **තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** |
| **පරිච්ඡේදය 06** | **-** | **මානව සම්පත් පැතිකඩ** |
| **පරිච්ඡේදය 07** | **-** | **අනුකූලතා වාර්තාව** |

**පටුන** **පිටු අංකය**


1.1 හැඳින්වීම ..... 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර ..... 1

1.3 අරමුණු, ප්‍රධාන කාර්යයන් ..... 2

1.4 සංවිධාන සටහන ..... 3

**02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ..... 4**

2.1 කාර්ය සාධනයට අදාළ තොරතුරු ..... 4

2.2 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2023.01.01දින සිට 2023.12.31 දක්වා) ..... 8

2.3 ඉලක්ක ..... 10

**03 පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය ..... 11**

3.1 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය…....11

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ..... 12

3.3 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ..... 13

3.4 මූල්‍ය සටහන් ප්‍රකාශය ..... 14

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ..... 15

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ..... 15

3.7 මු .රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ..... 16

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ..... 16

3.9 විගණකාධිපතිගේ වාර්තාව ..... 17

**04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය ..... 31**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ..... 31

**05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ..... 32**

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු ඉලක්කය - ..... 32

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ ..... 33**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ..... 33

6.2 කාර්ය මණ්ඩල තොරතුරු ..... 33

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන ආකාරය ..... 34

6.4 මානව සම්පත් සංවර්ධනය ..... 35

**07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව ..... 37**

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැදින්වීම

1999 වසරේදී අධිකරණ අමාත්‍යාංශය යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාව තුළ ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. 1999 අංක 46 දරන ප්‍රජා විශෝධන පනත යටතේ අධිකරණ 3කින් ආරම්භවූ නියමු ව්‍යාපෘතිය මේ වන විට දිවයින පුරා සංචාරක අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ 125ක ක්‍රියාත්මක වේ. සුළු වරදකරුවන් ප්‍රජා විශෝධන ක්‍රියාවලියට යොමු කිරීම තුළින් අධික බන්ධනාගාර තදබදය අඩු කිරීම හා එමගින් වරදකරුවන් නඩත්තුව සඳහා වැයවන අධික වියදම අවම කිරීම, සුළු වරදකරුවන් බන්ධනාගාර ගත කිරීම තුළින් සංවිධානාත්මක අපරාධකරුවන් බවට පත්වීමේ ඉඩකඩ වැළැක්වීම හා ඔවුන් වඩාත් ඵලදායී පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරීම සිදු වේ.

අධිකරණයේ සුළු වරදකරුවකු වූ පුද්ගලයෙකුට ප්‍රජා විශෝධන ආඥාවක් ලබාදීම තුළින් අපේක්ෂා කරනුයේ ප්‍රජාව තුළම තබා ඔහුගේ වරදකාරී චර්යා රටාවෙන් මුදවා, යහපත් පුරවැසියකු බවට පත් කිරිමට අවශ්‍ය කටයුතු කිරීමයි.

මේ සඳහා මහේස්ත්‍රාත් අධිකරණවල පිහිටුවා ඇති ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත දෙපාර්තමේන්තු නිලධාරින් විසින් විවිධ විශෝධන වැඩසටහන් සිදුකරනු ලබයි. නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ කටයුතු කරන ආඥාලාභියා නිවැරදි මගට යොමුකිරිම දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවයි.

විශෝධන ක්‍රියාවලිය අවසන් කරන ලද පුද්ගලයින් පිළිබඳව පසුවිපරම් කිරීම කාලීන අවශ්‍යතාවක් වි ඇති බැවින්, ඒ පිළිබඳවද අවධානය යොමු කරමින් මෙම දෙපාර්තමේන්තුව විසින් ආරම්භයට වඩා දෙපාර්තමේන්තුවේ කාර්ය පරාසය පුළුල් කර ඇත. එම කාර්යයන් සිදුකිරීම සඳහා දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා මෙම දෙපාර්තමේන්තුව මඟින් සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කොට ඇත.

### 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

**වරදින් මිදුණු යහපත් පුරවැසියෙක්**

**මෙහෙවර**

**පසුවිපරමක් සහිත ඵලදායී ප්‍රජා විශෝධන ක්‍රියාවලියක් තුළින් සුළු වරදකරුවන් හා ඔවුන්ගේ පවුල් සමාජීය, ආර්ථික, අධ්‍යාත්මික හා මානසික වශයෙන් සංවර්ධනය කිරීම.**


### 1.3 අරමුණු

1. 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත ක්‍රියාත්මක කිරිම මඟින් සුළු වරදකරුවන් බන්ධනාගාරගත කිරීම වෙනුවට ඔවුන් ප්‍රජාව තුළ තබා විශෝධනය කිරීම
2. ප්‍රජා පාදක විශෝධන ආඥා ක්‍රියාත්මක කිරීම මඟින් සුළු වරදකරුවන් බන්ධනාගාරගත කිරීම අවම කර බන්ධනාගාර තදබදය අඩුකිරීම හා ඒ සඳහා වැය වන රජයේ වියදම අවම කිරීම
3. ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනය සඳහා යොදා ගැනීම
4. ප්‍රජා විශෝධන ආඥාලාභීන් සහ ඔවුන්ගේ පවුල්වල මනෝ සමාජීය ගැටළු අවම කර ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම
5. ඵලදායී ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලියක් තුළින් සමාජගතවන සේවාලාභියා පිළිබඳ පසුවිපරමක් සිදුකර සාර්ථකත්වය මැන බැලීම

### ප්‍රධාන කාර්යයන්

1. මහේස්ත්‍රාත් අධිකරණ මඟින් සුළු වැරදිකරුවන් වූ පුද්ගලයින් ප්‍රජා පාදක විශෝධන නියෝග සඳහා ඇතුළත් කිරීම
2. ආඥාලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම
3. ආඥාලාභීන්ගේ මානසික සෞඛ්‍යය වර්ධනය හා උපදේශන වැඩසටහන් සංවිධානය කිරීම
4. ආඥාලාභීන්ගේ විශේෂ හැකියාවන් හා ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
5. ආඥාලාභීන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
6. ආඥාලාභින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන්, එම ඇබ්බැහිතාවයෙන් මුදවා ගැනීම සඳහා වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු කිරීම
7. පෞරුෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

1.4 සංවිධාන සටහන


කොමසාරිස් -1
නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (මෙහෙයුම්) -2
නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (පාලන) - 1
ගණකාධිකාරි - 1
අභ්‍යන්තර විගනක - 1
ජ්‍යෙෂ්ඨ ප්‍ර.වි.නි - 9 (පළාත් කාර්යාල)
ජ්‍යෙෂ්ඨ ප්‍ර.වි.නි - 1 (ප්‍රධානකාර්යාලය)
පරිපාලන නිලධාරී - 1
භාෂා පරිවර්තක - 1
ප්‍රාදේශීය කාර්යාල
ප්‍ර.වි.නි
වැඩ පරීක්ෂක
සංවර්ධනඅංශය
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කා.කා.ස
පාලන අංශය
සංවර්ධන නිලධාරී
තොරතුරුහා සන්නිවේදන තාක්ෂණ සහකාර
කළමනාකරණ සේවා නිලධාරී
ලිපිකරු
රියදුරු
කා.කා.ස
ගිණුම් අංශය
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
ලිපිකරු
කා.කා.ස
සංවර්ධන නිලධාරී (ප්‍රජා විශෝධන)
ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 කාර්ය සාධනයට අදාළ තොරතුරු


**අ) මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් සංඛ්‍යාව - පළාත් අනුව (2023.01.01– 2023.12.31)**

| අනු අංකය | පළාත | නියෝග ලැබූ ආඥාලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | බස්නාහිර | 3,710 |
| 02 | උතුර | 1,627 |
| 03 | වයඹ | 1,525 |
| 04 | නැගෙනහිර | 1,518 |
| 05 | මධ්‍යම | 1,296 |
| 06 | ඌව | 1,294 |
| 07 | සබරගමුව | 1,151 |
| 08 | දකුණ | 1,097 |
| 09 | උතුරු මැද | 808 |
| | **එකතුව** | **14,026** |


**ආ) මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් සංඛ්‍යාව - වරද අනුව (2023.01.01 – 2023.12.31)**

| අනු අංකය | වරද | නියෝග ලැබූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීතිවිරෝධී මත්පැන් | 4,891 |
| 02 | හෙරොයින් | 2,955 |
| 03 | ගංජා | 1,776 |
| 04 | රථවාහන වැරදි | 1,341 |
| 05 | මෙතම්ෆෙටමින් (අයිස්) | 697 |
| 06 | සූදුව | 604 |
| 07 | බීමත්ව අශෝභන ලෙස හැසිරීම | 588 |
| 08 | සොරකම් | 246 |
| 09 | ගෘහස්තප්‍රචණ්ඩත්වය | 85 |
| 10 | පාරිසරික වැරදි | 68 |
| 11 | සොරබඩු ලඟතබා ගැනීම | 64 |
| 12 | වංචා | 53 |
| 13 | මහජනසාමය කඩකිරීම් | 50 |
| 14 | කැරලිකෝලහාල | 23 |
| 15 | නීතිවිරෝධී අවි ආයුධ ලඟතබා ගැනීම | 12 |
| 16 | වෙනත් | 573 |
| | **එකතුව** | **14,026** |

**මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් - පළාත් අනුව**
**(2023.01.01 – 2023.12.31)**




**මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් - වරද අනුව**
(2023.01.01 – 2023.12.31)



ඇ) විශෝධන ආඥා පිළිබඳව තොරතුරු - (2023.01.01 සිට 2023.12.31 දක්වා)

| ලබා දී ඇති ආඥා සංඛ්‍යාව (a) | ආඥාව අවසන් කරන ලද ආඥාලාභීන් සංඛ්‍යාව හා එහි ප්‍රතිශතයක් ලෙස | | ලබා දී ඇති ආඥාලාභීන්ගෙන් ආඥා කඩ කළ සංඛ්‍යාව | | තව දුරටත් ක්‍රියාත්මක වන සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව (b) | ප්‍රතිශතය (b/a%) | සංඛ්‍යාව (c ) | ප්‍රතිශතය (c/a%) | සංඛ්‍යාව (c ) | ප්‍රතිශතය (c/a%) |
| 14,026 | 5,581 | 40% | 1,528 | 11% | 6,917 | 49% |

ඉ) පවත්වන ලද විශෝධන වැඩසටහන් පිළිබඳව තොරතුරු
(2023.01.01 සිට 2023.12.31 දක්වා)

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | උපදේශන (ඒකපුද්ගල - සැසි ගණන) | 14,978 | 15,425 |
| 02 | උපදේශන වැඩසටහන් (සමූහ) | 2,469 | 19,966 |
| 03 | මත් ප්‍රතිකාර සඳහා යොමු කිරීම | 2,370 | 2,790 |
| 04 | මත් නිවාරණ වැඩසටහන් | 1,406 | 21,737 |
| 05 | වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම | 612 | 4,110 |
| 06 | අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් | 1,077 | 10,155 |
| 07 | රුක් රෝපණ වැඩසටහන් | 2,225 | 9,414 |
| 08 | පොදු ස්ථාන පවිත්‍රතා ශ්‍රමදාන වැඩසටහන් | 2,938 | 14,475 |
| 09 | ආඥාලාභීන්ට ගෘහ ආර්ථික කළමණාකරණය හා සුළු පරිමාණ ව්‍යාපාර පිළිබඳව දැනුම ලබා දීම | 126 | 844 |
| 10 | ගෘහ ආර්ථික මූල්‍ය කළමණාකරණය | 792 | 2,809 |
| 11 | නිෂ්පාදන අලෙවි කිරීම සඳහා සූදානම් කිරීම, සුළු පරිමාණ ව්‍යාපාර කළමණාකරණය | 125 | 660 |
| 12 | ආඥාලාභීන්ට සුළු ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා ගැනීමට තාක්ෂණික සහායක ආයතන / මූල්‍ය ආයතන වෙත යොමු කිරීම | 101 | 277 |
| 13 | සුදුසු ස්වයං රැකියා ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර ලබා දීම | 55 | 186 |
| 14 | ප්‍රජාව දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම ප්‍රජා මුල සංවිධාන දැනුවත් කිරිම (ග්‍රාම නිලධාරී කොට්ඨාස ආවරණය වන පරිදි) | 1,465 | 39,784 |
| 15 | ප්‍රජාව දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන් පැවැත්වීම | 492 | 11,896 |
| 16 | රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි) | 165 | 7,073 |
| 17 | අධිකරණනිලධාරීන් හා නීතිඥවරුන්දැනුවත් කිරීම | 72 | 871 |
| 18 | පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම | 54 | 607 |
| | **එකතුව** | **31,522** | **163,079** |

- **2023 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුවට වෙන් වූ මුදල් යොදවා ආඥාලාභීන් විශෝධනය සඳහා සිදු කරන ලද වැඩසටහන් පිළිබඳව තොරතුරු**

| **අනු අංකය** | **වැඩසටහන** | **වැය කරන ලද මුදල (රු.)** |
|---|---|---|
| 01 | උපදේශන | 134,610.00 |
| 02 | වෛද්‍ය ප්‍රතිකාර | 29,365.00 |
| 03 | නිලධාරීන් දැනුවත් කිරීම | 98,085.00 |
| 04 | ශ්‍රමදාන | 62,280.00 |
| 05 | අධ්‍යාත්මික සංවර්ධන | 215,780.00 |
| 06 | වෘත්තීය පුහුණු | 54,187.00 |
| 07 | ආකල්ප සංවර්ධන | 72,935.00 |
| 08 | ගෘහ ආර්ථික කළමනාකරණ | 5,720.00 |
| 09 | විශේෂ දින | 37,355.00 |
| 10 | පවුල් හමු | 682,185.00 |
| 11 | 12 පියවර | 32,175.00 |
| 12 | වෙනත් | 21,387.00 |
| **එකතුව** | | **1,446,064.00** |

## 2.2 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2023.01.01 දින සිට 2023.12.31දක්වා)

**<u>මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීමේ ව්‍යාපෘතිය</u>**

ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරනු ලබන පුද්ගලයින්ගෙන් වැඩි ප්‍රතිශතයක් මත්ද්‍රව්‍ය හෝ මද්‍යසාර සම්බන්ධ වරදකරුවන් වන අතර, එම පුද්ගලයින් ඉන් මුදවා යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා විශේෂ අවධානය යොමු කර **"මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීමේ ව්‍යාපෘතිය"**ආරම්භ කර වර්තමානය වන විට ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘතිය මඟින් මත්ද්‍රව්‍ය සඳහා අබ්බැහි වූ පුද්ගලයන් ඉතා සාර්ථකව විශෝධනය කර ඔවුන් සමාජීය හා ආර්ථික වශයෙන් නඟා සිටුවීම සඳහා කටයුතු කරනු ලබයි. මෙහිදී මොවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කරනු ලබන අතර, ඒ සඳහා එක් එක් පුද්ගලයාගේ හැකියාව, කැමැත්ත, වෙළඳපල අනුව, ඔවුන් ස්වයං රැකියා සඳහා යොමු කිරීම මෙමඟින් සිදු කරනු ලබයි. ඒ අනුව මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වරදකරුවෙකු වූ පුද්ගලයෙක් විධිමත් ලෙස උපදේශන ක්‍රියාවලිය හා මත් ප්‍රතිකාර සඳහා යොමු කර වෛද්‍ය උපදෙස් පරිදි නේවාසික හෝ සායනික ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබයි. මීට සමගාමීව මෙම පුද්ගලයන්ට තම පවුල තුළ ඉතා විශ්වාසනීය හා ආරක්ෂිත වට පිටාවක් නිර්මාණය කිරීම සඳහා පවුල් සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කර යහපත් පුද්ගලයෙකු ලෙස සමාජ ගත කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. ප්‍රජා විශෝධන ක්‍රියාවලියෙන් පසුව ඉතා සාර්ථකව විශෝධනය වූ ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති මෙවැනි පුද්ගලයින්ට වෘත්තීය නිපුණතාවයක් ලබා ගැනීමට වෘත්තීය පුහුණු වැඩසටන් සඳහා යොමු කරනු ලබයි.

ස්වයං රැකියා ආරම්භ කිරීමට කැමැත්ත හා හැකියාව ඇති පුද්ගලයින් ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විධිමත්ව අධ්‍යයනය කර සුදුසු පුද්ගලයින් හඳුනාගෙන ඔවුන් ඒ සඳහා යොමු කරනු ලබයි.

ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මූලික ප්‍රාග්ධනයක් හෝ සලසා ගැනීමට නොහැකි පුද්ගලයින් සඳහා, මෙම ව්‍යාපෘතිය යටතේ රු. 50,000.00ක උපරිමයකට යටත්ව ආධාර මුදලක් අදාළ ප්‍රාදේශීය ලේකම් මඟින් (උපකරණ හෝ අමු ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා) ලබා දීමට කටයුතු කරනු ලබයි. එමෙන්ම ආඥාලාභීන්ගේ ශ්‍රමය ඵලදායි ලෙස යෙදවීම සඳහා නිෂ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමු කර ඇත. ඒ අනුව 2023 වර්ෂයේ පුද්ගලයින් 38ක් සඳහා හඳුනා ගන්නා ලද ස්වයං රැකියා ව්‍යාපෘති 38ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.1,788,330.00 මුදලක්ද ඵලදායි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.29,950.00ක මුදලක් ලබා දී ඇත. මේ යටතේ කුකුළු පාලනය, ගව පාලනය, එළු පාලනය, පොල්කටු ආශ්‍රිත නිෂ්පාදන, විසිතුරු මත්ස්‍ය වගාව, පැස්සුම් වැඩ, යතුරුපැදි අලුත්වැඩියාව, කෙටිකෑම නිෂ්පාදනය, බුලත් වගාව, මේසන් වැඩ, ධීවර හා කෘෂි භෝග වගාව වැනි ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

# සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2023.01.01 දින සිට 2023.12.31දක්වා)

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | වැය කරන ලද කාරණය | වැය වූ මුදල (රු.) | මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් සංඛ්‍යාව | සම්පූර්ණ කරන ලද නියෝග සංඛ්‍යාව | සාර්ථකව විශෝධනය කරන ලද | |
| | | | | | | | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීම | 2,500,000.00 | නියෝග ක්‍රියාත්මක කිරීම | | | 9,284 | 3,120 | 1,230 | 39.4% |
| | | සාර්ථකව විශෝධනය කරන ලද ආඥාලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන සඳහා හඳුනාගන්නා ලද ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආධාර ලබා දී ඇත. | 1,818,250.00 | 72.7% | | | | |

## 2.3 ඉලක්ක

01. සුළු වැරදි සම්බන්ධ වරදකරුවන් වන පුද්ගලයින් ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කර ගැනීම, වැඩි කර ගැනීම හා විශෝධන කටයුතුවල සාර්ථකත්වය වැඩි කිරීම

02. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
    - ❖ ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරි හා ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය හා එහි ප්‍රවණතා පිළිබඳව දැනුවත් කිරීම
    - ❖ සංවර්ධන නිලධාරීන් සඳහා උපදේශනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව ලබාදීම තවදුරටත් සිදු කිරීම
    - ❖ සියලුම නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම
    - ❖ ප්‍රජා විශෝධනය හා ඊට අදාළ වන අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව විදේශීය පුහුණුව ලබාදීම

03.ප්‍රතිකාර ක්‍රියාවලිය විධිමත් කිරීම
    - ❖ ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ප්‍රතිකාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම (සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ රෝහල් ආශ්‍රිතව)

04. සාර්ථකව විශෝධනය වන ආඥාලාභීන් සුළු පරිමාණ ව්‍යවසායකයන් බවට පත් කිරීම

05. ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය මහජනතාවට සමීප කිරීම සඳහා ප්‍රචාරණ කටයුතු පුළුල් කිරීම

06. ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලියේ තොරතුරු කළමනාකරණය කිරීම සඳහා කටයුතු කිරීම
    - ❖ වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වාගෙන යෑම
    - ❖ ආඥාලාභී තොරතුරු කළමනාකරණ පද්ධතිය පවත්වාගෙන යෑම

07. ප්‍රජා පාදක විශෝධන පනත සඳහා අවශ්‍ය සංශෝධනයන් සිදු කරමින් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කිරීම

08. ආඥාලාභීන්ගේ බහුතරය මත්පැන් සහ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයන් බැවින් ප්‍රතිකාර ක්‍රමවේදයක් මඟින් පුද්ගලයන් විශෝධනයට ලක් කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම.

09. සංවර්ධන නිලධාරීන් හරහා ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ පසු විපරම් ක්‍රියාවලිය වඩාත් විධිමත්ව තවදුරටත් සිදු කිරීම.

10. ආඥාලාභීන් සාර්ථකව විශෝධනය කිරීමෙන් අනතුරුව වරදින් මිදුණු යහපත් පුද්ගලයින් බවට පත් කිරීම හා ඔවුන්ගේ පවුල් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කිරීම.

## 03 පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය

### 3.1 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | තත්‍ය 2023 | 2022 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 510,666,000 | 485,014,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 245,500 | 240,143 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 11,994,061 | 10,575,569 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **522,905,561** | **495,829,712** | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | **522,905,561** | **495,829,712** | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 0.68 | 0.31 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 522,905,560 | 495,829,711 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| 483,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 449,031,515 | 437,177,484 | ඒසීඒ-2(ii) |
| 83,000,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 71,295,035 | 46,594,990 | ඒසීඒ-2(ii) |
| 3,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 2,703,085 | 2,967,779 | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 200,000 | ඒසීඒ-2(ii) |
| 569,000,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | **523,029,635** | **486,940,253** | |
| | මූලධන වියදම් | | | | |
| 4,850,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 3,269,183 | 2,510,951.00 | ඒසීඒ-2(ii) |
| 2,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 1,999,068 | 246,804.00 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 1,500,000 | හැකියා වර්ධනය | 14 | 1,421,650 | 1,258,795.00 | ඒසීඒ-2(ii) |
| 2,500,000 | වෙනත් මූලධන වියදම් | 15 | 1,818,250 | 669,500.00 | ඒසීඒ-2(ii) |
| 10,850,000 | මුළු මූලධන වියදම් (උ) | | **8,508,151** | **4,686,050** | |
| | තැන්පතු ගෙවීම් | | 381,974 | 281,514.00 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 22,202,630 | 11,357,207.00 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 22,584,604 | 11,638,721 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 554,122,390 | 503,265,023 | |
| 579,850,000 | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (31,216,829) | (7,435,312) | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (31,216,829) | (7,435,312) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | 0 | 0 | ඒසීඒ-3 |
| | | | (31,216,829) | (7,435,312) | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | සත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 59,016,398 | 47,816,467 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 43,743,752 | 33,535,182 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | **102,760,150** | **81,351,650** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 43,685,002 | 33,339,959 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 59,016,398 | 47,816,467 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 58,750 | 195,224 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | **102,760,150** | **81,351,650** |

පිටු අංක 07 සිට 41 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 42 සිට 45 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

..............................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර : එම්.එන්. රණසිංහ
දිනය : 2024.02. ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නො. 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

..............................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2024/02/21
දිලාන් ගුණරත්න
කොමසාරිස්
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

..............................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : R.K තරංගා
දිනය : 2024/02/20
ආර්.කල්පනී තරංගා
ගණකාධිකාරී
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

## 3.3 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | | |
|---|---|---|---|
| | | 2023<br>රු. | 2022<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 19,820,565 | 19,770,116 |
| අග්‍රිම ලැබීම් | | 510,666,000 | 485,014,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 10,397,361 | 9,962,409 |
| තැන්පතු ලැබීම් | | 245,500 | 240,143 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | | **541,129,426** | **514,986,668** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 512,158,318 | 483,270,594 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 2,703,085 | 2,967,779 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 304,474 | 16,126,815 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 0.68 | 0.31 |
| අත්තිකාරම් ගෙවීම් | | 19,921,137 | 9,588,960 |
| තැන්පතු ගෙවීම් | | 381,974 | 281,514 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | | **535,468,988** | **512,235,662** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | | **5,660,438** | **2,751,006** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| මූලධන වියදම් | | 5,660,438 | 2,751,006 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | | **5,660,438** | **2,751,006** |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | | **(5,660,438)** | **(2,751,006)** |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | | (0) | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | | - | - |

## 3.4 මූල්‍ය සටහන් ප්‍රකාශය

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

- තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

**3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය**

| | | | | රු. 000 |
|---|---|---|---|---|---|
| ආදායම්සංකේතය | ආදායම් විස්තරය | ආදායම්ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
| | | මූලික ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | අදාළනැත | | | | |

**3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය**

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම (රු.) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය (රු.) | අවසාන ප්‍රතිපාදනය (රු.) | | |
| පුනරාවර්තන | 550,000,000.00 | 569,000,000.00 | 523,029,635.00 | 91.92% |
| ප්‍රාග්ධන | 10,000,000.00 | 10,850,000.00 | 8,508,151.00 | 78.41% |

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන | | තත්‍ය වියදම(රු.) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ප්‍රතිපාදන(රු.) | අවසාන ප්‍රතිපාදනය(රු.) | | |
| 1 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ( 253-1-2-4-1502-12 ) | 304,474.05 | 304,474.05 | 304,474.05 | 100% |

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | වත්කම් කේත විස්තරය | 2023.12.31 දිනටභාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය(රු.) | 2023.12.31 දිනටමූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය(රු.) | ඉදිරියේදීගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| 9157 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 59,016,398.00 | 59,016,398.00 | - | 100% |

## 3.9 විගණකාධිපතිගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/F/DCBC/FS/04/2023 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 මැයි 16 දින

කොමසාරිස්

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA-6) මිලදී ගැනීම් සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 80 වාර්තා අනුව වර්ෂයේ මිලදී ගැනීම්වල එකතුව අතර රු. 9,200,863 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, එම වෙනසට හේතුව කුමක්ද යන්න මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මඟින් පැහැදිළිව දක්වා නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය කාර්යාලවල පවතින ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර, CIGAS පද්ධතියට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම සහ එහි සංචිත වටිනාකමෙහි නිවැරදි අගය නිරීක්ෂණය නොවී ය.

### 1.6.2 මූල්‍ය වත්කම්

භෞතික වත්කම් විකිණීමෙන් ලද රු.86,850 ක් වූ මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ භෞතික වත්කම් විකිණීමෙන් ලද ආදායම ලෙස දැක්විය යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායමට ඇතුළත් කර තිබුණි.

### 1.6.3 දේපල පිරියත හා උපකරණ සංචිතය

සමාලෝචිත වර්ෂය තුළදී අපහරණය කරන ලද භාණ්ඩවල ගත් මිල ස්ථාවර වත්කම්වලින් ඉවත්කර නොතිබූ අතර, එම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දේපල, පිරියත හා උපකරණවල වටිනාකම හා එහි සංචිත වටිනාකමෙහි නිවැරදි අගය පෙන්නුම් නොකෙරිණි.

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ණය සහ අත්තිකාරම් පිළිබඳ ණයගැති ලේඛනය | 2023 නොවැම්බර් 07 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 03/2023 හි 05 ඡේදය | පවත්වා නොතිබුණි |
| ණය සහ අත්තිකාරම් පිළිබඳ ණයහිමියන්ගේ ලේඛනය | -එම- | පවත්වා නොතිබුණි |
| අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් වූ පාලන ගිණුම | -එම- | පවත්වා නොතිබුණි |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂය සඳහා දේශීය ගමන් වියදම් සහ ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා වාර්ෂික ඇස්තමේන්තුව තුළ වෙන්කළ පිළිවෙලින් රු.18,000,000 ක සහ රු.3,000,000 ක ප්‍රතිපාදනවලට අතිරේකව පරිපූරක අයවැය ඇස්තමේන්තුව යටතේ පිළිවෙලින් රු.7,500,000 ක් සහ රු.850,000 ක ප්‍රතිපාදන ලබාගෙන තිබූ නමුත්, වර්ෂ අවසානයට පිළිවෙලින් රු.8,505,447 ක් හා රු.1,002,287 ක මුදලක් එනම් පරිපූරක අයවැය ඇස්තමේන්තුවෙන් ලබාදී තිබූ ප්‍රතිපාදනවලින් සියයට 113 ක සහ සියයට 118 ක ප්‍රතිශතයක් ඉතිරිවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වෙනත් දීමනා වැය විෂයය සහ ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා වැය විෂයය සඳහා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනවලට අතිරේකව මුදල් රෙගුලාසි 66 මාරුකිරීම යටතේ පිළිවෙලින් රු.3,000,000 ක සහ රු.1,500,000 ක ප්‍රතිපාදන මාරුකර තිබුණද, වර්ෂ අවසානයට පිළිවෙලින් රු.1,759,144 ක් සහ රු.420,059 ක මුදලක්, එනම් මුදල් රෙගුලාසි 66 මාරුකිරීම්වලින් පිළිවෙලින් සියයට 59 ක් හා සියයට 28 ක් ඉතිරිවී තිබුණි.

(ඇ) ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳ චක්‍රලේඛයෙහි 03 (xvii) වගන්තිය අනුව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම්, ඒවා වර්ෂය අවසන්වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 5 ක රු.6,260,000 ක් වූ ප්‍රතිපාදන සහ මූලධන වැය විෂයයක රු.1,000,000 ක් වූ ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි.

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ හා බැරකම් ලේඛනයේ ඇතුළත් නොවූ රු.212,835 ක බැරකම් 2024 වර්ෂයේදී නිරවුල් කර තිබුණි.

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) අංක CA/1/1/16/1 හා 2010 ජූලි මස 09 දිනැති ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා 1993/12/31 දිනැති අංක පීපීඒ/6/1/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | නිලධාරීන් හතරදෙනෙකු විසින් චක්‍රලේඛය පරිදි වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 447 (1) | චක්‍රලේඛය ප්‍රකාරව පොදු 138 වැය ලෙජරයෙහි බැඳී ඇති බැරකම් පිළිබඳව දක්වා නොතිබුණි. |
| (ii) මු.රෙ. 447 (4) හා (5) | චක්‍රලේඛය ප්‍රකාරව සියලු බැරකම් ඒවා සිදු වූ විගස ගිණුමේ වම් පැත්තේ සටහන් කළ යුතු වුව ද, බැරකම් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2023 | |
| (i) 06 ඡේදය | මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්තාකරන ආයතනයේ වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුව ද, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය, පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය සහ අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රකාශන තුළ හිස් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 8.3 ඡේදය | සියලුම වාර්තාකරණ ආයතන විසින් තැන්පතු සඳහා සැසඳීම් ප්‍රකාශය පිළියෙල කර 2024 පෙබරවාරි 28 වැනි දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත පිටපතක් සහිතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, එසේ සිදු කර නොතිබුණි. |
| (ඇ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020, 04 ඡේදය | ඉදිරි වර්ෂයේ පුනරාවර්ථන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුව ද, 2023 වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම තුළ ප්‍රාග්ධන වැඩසටහන් පමණක් ඇතුළත් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් 2022 දෙසැම්බර් 30 දින අනුමත කර තිබුණි. |
| (ඉ) 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 | |
| (i) 01 ඡේදය | ආයතනයේ සේවය නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. |
| (ii) 6.1 ඡේදය | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු විය යුතු වුව ද, එසේ පුහුණු සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර නොතිබුණි. |

2.5 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව, කිසියම් විශේෂිත කාර්යයක් සඳහා තත්කාර්ය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම එම තත්කාර්ය අතුරු අග්‍රිමය පියවිය යුතු වුව ද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අවස්ථා 07 කදී ලබාගත් අතුරු අග්‍රිම පියවීමට දින 16 සිට දින 86 දක්වා කාලපරාසයක් ප්‍රමාද කර තිබුණි.

(ආ) අත්තිකාරම් ලබාදීමේදී අදාළ කාර්යය නිසි ලෙස ඇගයීමට ලක් නොකිරීම හේතුවෙන් 2023 වර්ෂයේදී ලබා දුන් තත්කාර්ය අතුරු අග්‍රිමවලින් නැවත පියවීමේ ප්‍රතිශතය සියයට 36 සිට සියයට 54 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව, අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31 වැනි දින හෝ ඊට පෙර නැවත පියවිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් ශාඛාවන් 6 කට අදාළව රු.24,840 ක් වටිනා සුළු මුදල් 2024 පෙබරවාරි 15 දින පියවා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) ක්‍රියාකාරී සැලැස්ම තුළ අම්පාර ප්‍රජා විශෝධන කාර්යාලය අලුත්වැඩියා කිරීම සඳහා රු.900,000 ක් ඇස්තමේන්තු කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ මෙම ක්‍රියාකාරකම සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී රු.700,000 ක් වැය කර ඇඟිලි සළකුණු යන්ත්‍ර මිලදී ගැනීමට ද රු.700,000 ක් වැය කර ප්‍රධාන කාර්යාලය සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සහ රු.580,000 ක් වැය කර යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට ද සැලැසුම් කළ ද, සැලසුම් කළ පරිදි එම කාර්යයන් සිදුකර නොතිබුණි.

### 3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා වන නෛතික හා අධිකරණමය කරුණු සොයා බැලීමට පත්කළ කාර්යසාධන බලකාය විසින් ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය බන්ධනාගාර තදබදය අවම කිරීමට මූලික විකල්පයක් ලෙස හඳුනාගෙන ඇති අතර, ප්‍රජා විශෝධන ක්‍රියාවලියේ නිරත නිලධාරීන්ට තම කටයුතු බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් හා කාර්යාලීය පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබාදිය යුතු වුවත්, පළාත් 9 කට අදාළව මහේස්ත්‍රාත් අධිකරණවල පිහිටුවා තිබෙන ප්‍රජා විශෝධන කාර්යාල 49 ක ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැතිවීම නිසා ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීමට බාධාවක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් අංක DCBC/EST/04 හා 2022 අප්‍රේල් 04 දිනැති ප්‍රජා විශෝධන කොමසාරිස්ගේ ලිපිය මගින් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ අවධානයට යොමුකර තිබුණ ද, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පියවරගෙන නොතිබුණි.

(ආ) ප්‍රජා විශෝධන ක්‍රියාවලියේ ප්‍රගතිය මැන බැලීම සඳහා ක්ෂේත්‍ර අධීක්ෂණ 15 ක් සිදු කිරීමට වර්ෂය තුළ සැලසුම් කළ ද, ක්ෂේත්‍ර අධීක්ෂණ 07 ක් එනම් සියයට 47 ක් පමණක් වර්ෂය තුළ සිදුකර තිබුණි.

(ඇ) ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ප්‍රචලිත කිරීම සඳහා වර්ෂය තුළදී පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමට වැඩ සටහන් 105 ක් පමණ සැලසුම් කර තිබුණද, වර්ෂය තුළදී වැඩ සටහන් 54 ක් පමණක් එනම් සියයට 51ක් පමණ නිම කර තිබුණි.

### 3.1.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පුත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවේ 2010 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ අධිකරණ අමාත්‍යාංශය විසින් රු.1,009,934 ක මුදල් වියදම් කර තිබුණ ද, ඉදිකිරීම් කටයුතු අවසන්වී නොතිබුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 7 ඡේදය ප්‍රකාරව එක් එක් ආයතනය විසින් මිලදීගන්නා සහ අපහරණය කරන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.13,830 ක් වටිනා විදුලි උපාංග පිළිබඳව හා සමාලෝචිත වර්ෂයේදී අපහරණය කරන ලද භාණ්ඩ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 880 අනුව රජයේ නිලධාරීන්ට ඇප තැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආදියේ භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින් නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළ යුතු යැයි සඳහන් කර තිබුණ ද, මුදල් රෙගුලාසි 315 හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මුදල් තැන්පත් කර නොතිබුණි.

## 3.4 පාඩු හා හානි

පුත්තලම අධිකරණ පරිශ්‍රයේ කාමරයක් තුළ පවත්වාගෙන ගිය ප්‍රජා විශෝධන කාර්යාලයේ 2022 ජුනි 31 දින ඇති වූ හදිසි ගින්නකින් එම කාර්යාලයේ තිබූ, පිරිවැය රු.163,302 ක් වූ කාර්යාල උපකරණ සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබූ අතර, ඒ පිළිබඳව 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් කර නොතිබුණි.

## 3.5 කළමනාකරණ දුර්වලතා

(අ) නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම අධීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ඇතුළු දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල ආවරණය වන පරිදි 2018 වර්ෂයේ රු. 2,889,145 ක් වැයකර ඇඟිලි සලකුණු යන්ත්‍ර 97 ක් ස්ථාපිත කර තිබුණු අතර, ප්‍රාදේශීය කාර්යාල බොහෝමයක අඩු පහසුකම් සහිතව කුඩා කාමරවල පවත්වාගෙන යන කාර්යාලවල තාවකාලික විදුලි පරිපථ සකස්කර මෙම යන්ත්‍ර සවිකර තිබුණි. ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන සියලු ප්‍රාදේශීය කාර්යාලවල තොරතුරු ලබාගැනීමේ දත්ත පද්ධතිය සමාලෝචිත වර්ෂය තුළදී ද, වැඩි දියුණු කර නොතිබීම තුළ ඇඟිලි සළකුණු යන්ත්‍ර ස්ථාපනය කිරීමෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගෙන නොතිබුණි.

(ආ) වසර 10 කට වැඩි කාලයක සිට නිලධාරියකුගෙන් අයවිය යුතුව තිබූ රු.128,520 ක් වූ ආපදා ණයශේෂය හා රු.2,500 ක් වූ උත්සව අත්තිකාරම් ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පුත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය ඉදිකිරීම ප්‍රමාදවීම නිසා ප්‍රජා විශෝධන ක්‍රියාවලියේ නියැලී සිටින නිලධාරීන්ට, ප්‍රජා විශෝධන වරදකරුවන් උපදේශනයට ලක්කිරීම හා අනෙකුත් කාර්යාල කටයුතු විවිධ දුෂ්කරතා යටතේ අධිකරණ පරිශ්‍රයේ පිහිටි අඩි 11 x 11 වර්ග ප්‍රමාණයකින් යුත් කුඩා කාමරයක පවත්වාගෙන ගොස් තිබුණු අතර, 2022 ජූනි 21 දින පස්වරු 5.00 ට පමණ හදිසියේ ඇති වූ ගින්නකින් කාර්යාලයේ පැවති පරිගණක යන්ත්‍රය හා එහි සියලු කොටස් , ඡායා පිටපත් යන්ත්‍රය, ඇඟිලි සළකුණු යන්ත්‍රය හා අනෙකුත් කාර්යාල උපකරණ සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළදී ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව විසින්, විනාශ වූ ස්ථානය වෙනුවට වෙනත් තාවකාලික ස්ථානයක් සොයා ගැනීමට හෝ අඩක් ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.

## 4. තිරසාර සංවර්ධනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළදී තිරසර සංවර්ධන අරමුණක් හඳුනාගෙන තිබූ අතර, එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ප්‍රධාන ඉලක්ක තුනක් පිළියෙල කර තිබුණි. ඉන් ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරන පුද්ගලයින්ගෙන් සියයට 40 ක ප්‍රමාණයක් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තුළින් යහපත් පුද්ගලයින් බවට පත් කිරීමට ඉලක්ක කර තිබුණ ද, එහි ප්‍රගතිය සියයට 45 ක මට්ටමක පැවතුණු අතර, මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් සඳහා මත් ප්‍රතිකාර කිරීම තුළින් ඉන් සියයට 35 ත් 40 ත් අතර ප්‍රමාණයක් මුදවා ගැනීමට ඉලක්ක කළ ද, එය සියයට 40 ක මට්ටමක පැවතිණි. එසේම ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරන පුද්ගලයින්ගේ සමාජ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා සාමාජීය , ආර්ථික හා අධ්‍යාත්මික වශයෙන් නඟා සිටුවීම අරමුණු කර තිබුණ ද, එම අරමුණුකරා ළඟාවීමේ ඉලක්ක හඳුනාගෙන නොතිබුණි.

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

## 6. මානව සම්පත් කළමනාකරණය

### 6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) දෙපාර්තමේන්තුවෙහි 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 6 | 3 | 3 |
| තෘතියික මට්ටම | 137 | 117 | 20 |
| ද්විතීක මට්ටම | 666 | 640 | 26 |
| ප්‍රාථමික මට්ටම | 12 | 6 | 6 |
| එකතුව | 821 | 766 | 55 |

(ආ) ඵලදායී සේවා මට්ටමක් පවත්වාගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳව කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු 03 ක් ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 20 ක් ද, ද්විතීක මට්ටමේ පුරප්පාඩු 26 ක් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 6 ක් ද වශයෙන් දෙපාර්තමේන්තුවේ සමස්ත පුරප්පාඩු 55 ක් පැවතිණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ පාලන මෙහෙයුම් ධූරාවලියේ ප්‍රධාන පරිපාලන තනතුර වන ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී තනතුරු 10 ක් සඳහා අනුමැතිය ලැබී තිබුණද, 2010 වර්ෂයේ සිට මෙම තනතුරු පුරප්පාඩුව පවතින අතර, එම නිත්‍ය තනතුරු සඳහා බඳවාගැනීම් පරිපාටින්ට අනුව උසස් කිරීමෙන් හෝ බඳවාගැනීමෙන් තොරව රාජකාරි ආවරණය කිරීමට ප්‍රජා විශෝධන නිලධාරීන් පත්කර තිබුණි.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

## 04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| කාර්ය සාධක දර්ශකය | ප්‍රගතිය මැනීමේ දර්ශක | ප්‍රගතිය | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරනු ලබන වැරදිකරුවන් සාර්ථකව විශෝධනය කිරීම | වරදකරුවන් සංඛ්‍යාව (වාර්ෂික ඉලක්කය 12000 කි) | 14,026 | 116% |
| | නියෝග සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | 5,581 | 39.7% |
| | සාර්ථකව විශෝධනය කරන ලද සංඛ්‍යාව | 2,521 | 45.1% |
| ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරන ලද මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් සාර්ථකව විශෝධනය කිරීම | මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් සංඛ්‍යාව | 9,284 | 66.2% |
| | නියෝග සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | 3,120 | 33.6% |
| | සාර්ථකව විශෝධනය කරන ලද සංඛ්‍යාව | 1,230 | 39.4% |
| සාර්ථකව විශෝධනය කරනු ලබන පුද්ගලයින්ගේ ජීවන තත්වය උසස් කිරීම | සාර්ථකව විශෝධනය කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | 2,521 | 45.1% |
| | ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව | 38 | |
| | ජීවන මට්ටම උසස් කර ගත් පුද්ගලයින් සංඛ්‍යාව | මෙම පුද්ගලයින්ගේ ජීවන මට්ටම උසස් වීම පිළිබඳව ඇගයීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවම වශයෙන් වර්ෂයක කාලයක් ගත විය යුතු වේ. | |
| කඩ කිරීම් අවම මට්ටමක පවත්වාගෙන යෑම | යොමු කරන ලද සංඛ්‍යාව | 14,026 | |
| | නියෝග කඩ කරන ලද සංඛ්‍යාව | 1,528 | 10.8% |

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම | | |
|---|---|---|---|
| | 100% -90% | 75% - 89% | 50% -74% |
| සමස්ත කාර්ය සාධන දර්ශකය | | | 69.3 % |

## 05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු ඉලක්කය-ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ සැමට යුක්තිය සඳහා සමාන ප්‍රවේශය සහතික කිරීම

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණදර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| සුළු වැරදි සඳහා වරදකරුවන් වන පුද්ගලයින්ට අධිකරණයට ඉදිරිපත්වී නීතියට ප්‍රවේශවීමේ සම අයිතිය තහවුරු කිරීම හා එම වැරදිවලින් මිදී යහපත් පුරවැසියන් ලෙස ජීවත්වීම සඳහා ඉඩ ප්‍රස්ථා සැලසීම. | සුළු වැරදි සඳහා වැරදිකරුවන් වී ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරනු ලබන පුද්ගලයින් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තුළින් යහපත් පුද්ගලයින් බවට පත් කිරීම | සුළු වැරදි සඳහා වැරදිකරුවන් වී ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරනු ලබන පුද්ගලයින්ගෙන් 40% ක ප්‍රමාණයක් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තුළින් යහපත් පුද්ගලයින් බවට පත් කිරීම | 45.1% | | |
| | ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරන ලද පුද්ගලයින් අතරින් මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් සඳහා මත් ප්‍රතිකාර කිරීම | මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් සඳහා මත් ප්‍රතිකාර කිරීම තුළින් ඉන් 35 – 40% ක ප්‍රමාණයක් ඉන් මුදවා ගැනීම | 39.4% | | |
| | ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරන ලද පුද්ගලයින්ගේ සමාජ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා සාමාජීය,ආර්ථික හා අධ්‍යාත්මික වශයෙන් නඟා සිටුවීම | - | - | - | - |

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 6 | 3 | 3 |
| තෘතීයික | 137 | 117 | 20 |
| ද්විතියික | 662 | 640 | 22 |
| ප්‍රාථමික | 12 | 6 | 6 |

### 6.2 කාර්ය මණ්ඩල තොරතුරු(2023.01.01 -2023.12.31)

| අ.අ. | තනතුර | | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | ප්‍රජා විශෝධන කොමසාරිස් | | 01 | 01 | - |
| 2 | සහකාර කොමසාරිස් / නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ.II හෝ III | 01 | - | 01 |
| | | දෙපාර්තමේන්තු ගත | 02 | 01 | 01 |
| 3 | ගණකාධිකාරී | | 01 | 01 | - |
| 4 | අභ්‍යන්තර විගණක | | 01 | - | 01 |
| 5 | පරිපාලන නිලධාරී | | 01 | - | 01 |
| 6 | ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී | | 10 | - | 10 |
| 7 | භාෂා පරිවර්තක (දෙමළ) | | 01 | - | 01 |
| 8 | ප්‍රජා විශෝධන නිලධාරී | | 125 | 117 | 8 |
| 10 | සංවර්ධන නිලධාරී | | 515 | 507 | 8 |
| 11 | තොරතුරු සන්නිවේදන සහකාර | | 02 | 02 | - |
| 12 | රාජ්‍ය කළමනාකරණ සහකාර ලිපිකරු | | 20 | 09<br>05 | 06 |
| 13 | වැඩපරීක්ෂක | | 125 | 117<br>01 * | 07 |
| 14 | කාර්යාල කාර්ය සහායක | | 08 | 06 | 02 |
| 15 | රියදුරු | | 04 | - | 04 |
| **එකතුව** | | | **817** | **767** | **50** |

*ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මිය ගිය සේවකයෙකුට වැටුප් ගෙවනු ලැබේ

### 6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන ආකාරය

මේ වනවිට දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහල නැංවීම උදෙසා අත්‍යවශ්‍යම තනතුරු සඳහා පුරප්පාඩු පවතී. උදාහරණ ලෙස,

- සහකාර කොමසාරිස් (ශ්‍රී ලං.ප.සේ III/II) – 01
- සහකාර කොමසාරිස් - මෙහෙයුම් (දෙපාර්තමේන්තුගත) 01
- අභ්‍යන්තර විගනක - 01
- පරිපාලන නිලධාරී - 01
- ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී - 10 (සම්මුඛ පරීක්ෂණ අවසන් කර පරීක්ෂණ ගොනු රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.)
- භාෂා පරිවර්තක - 01
- ප්‍රජා විශෝධන නිලධාරී - 08
- වැඩ පරීක්ෂක - 07
- රාජ්‍ය කළමනාකරණ සහකාර -06
- රියදුරු - 04, ලෙස දැක්විය හැකිය.

මේ තත්වය යටතේ දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව ඉටු කිරීමේ බාධා ඇත. විධායක මට්ටමේ තනතුරු පුරප්පාඩු වීම මත ආයතනයේ දැනට සේවයේ නියුතු 766 දෙනෙකුගේ පරිපාලන හා ආයතන කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාමටත් පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමටත් බාධා සිදු වේ. එමෙන්ම ප්‍රජා විශෝධන නිලධාරී හා වැඩ පරීක්ෂක පුරප්පාඩු වීම හේතුවෙන් ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාල නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මත ආයතනයේ ප්‍රධාන කාර්ය භාරය වන ආඥාලාභීන් විශෝධනය කිරීමේ කටයුතු සඳහා බාධා සිදු වේ. ප්‍රමාණවත් පරිදි අධීක්ෂණ මට්ටමේ නිලධාරි නොමැතිකම දෙපාර්තමේන්තුවේ දැක්ම සඳහා ළඟා වීමට බාධාවක් වේ.

ආයතනයක පවතින මානව සම්පත කාර්යක්ෂමව හා ඵලදායි ලෙස සේවයේ යෙදවීම සඳහා ධාරිතාවය සංවර්ධනය කළ යුතුය. ඒ අනුව දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත. ඒ සඳහා ආයතනයේ ඉහළ සිට පහළ දක්වා වූ කාර්ය මණ්ඩලය කුසලතාවලින් පරිපූර්ණය කළ යුතු වේ. මෙහිදී එක් එක් නිලධාරී කාණ්ඩයේ රාජකාරි ස්වභාවය අනුව ලබා දිය යුතු කුසලතාවය හඳුනාගෙන එම කුසලතාවයන් ප්‍රගුණ කිරීම සඳහා පුහුණු වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම දෙපාර්තමේන්තුවේ දැක්ම මෙහෙවර අරමුණු ළඟාකරගැනීම සඳහා පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමට අදාළව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව දෙපාර්තමේන්තුවට යොමු කරනු ලබන සුළු වරදකරුවන් වැරදිවලින් මුදවාගෙන යහපත් පුරවැසියෙක් ලෙස සමාජගත කිරීම සඳහා නිලධාරීන්ට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා වන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මෙහිදී පුද්ගලයින්ගේ චර්යාත්මක වෙනසක් ඇති කිරීම හා සමාජ සංවර්ධන කටයුතු සිදු කිරීමට අදාළ දැනුම ලබා දීම සිදු කෙරේ. එමෙන්ම දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු නිසි පරිදි සිදුකර ගැනීමට අවශ්‍ය කාර්යාල කළමනාකරණයට අදාළ ධාරිතාවය සංවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා 2023 වර්ෂයේ 6.4හි සඳහන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

### 6.4 මානව සම්පත් සංවර්ධනය

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | දින ගණන | සමස්ථ ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | | |
| 01 | ආකල්ප සංවර්ධනය හා මහජන සම්බන්ධතා වර්ධනය කිරීම-දකුණු පළාත | 120 | දින 01 | 65,200.00 | | දේශීය | නිලධාරීන්ගේ ආකල්ප හා පෞරුෂ සංවර්ධනය වීම |
| 02 | ආකල්ප සංවර්ධනය හා පෞරුෂ සංවර්ධන වැඩමුළුව-ගම්පහ දිස්ත්‍රික්කය | 32 | දින 01 | 19,750.00 | | දේශීය | |
| 03 | ආකල්ප සංවර්ධනය හා සාමූහිකත්ව ගුණාංග වර්ධනය කිරීම-ප්‍රධාන කාර්යාලය | 40 | දින 01 | 5,460.00 | | දේශීය | |
| 04 | ආකල්ප සංවර්ධනය හා පෞරුෂ සංවර්ධන වැඩමුළුව-වයඹ පළාත | 51 | දින 01 | 13,350.00 | | දේශීය | |
| 05 | ආකල්ප සංවර්ධනය හා පෞරුෂ සංවර්ධන වැඩමුළුව-හම්බන්තොට දිස්ත්‍රික්කය | 56 | දින 01 | 7,140.00 | | දේශීය | |
| 06 | ආකල්ප සංවර්ධනය හා පෞරුෂ සංවර්ධන වැඩමුළුව-ගාල්ල දිස්ත්‍රික්කය | 66 | දින 01 | 6,160.00 | | දේශීය | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 07 | ආකල්ප සංවර්ධනය හා පෞරුෂ සංවර්ධන වැඩමුළුව-බස්නාහිර පළාත | 81 | දින 01 | 6,650.00 | | දේශීය | |
| 08 | ආකල්ප සංවර්ධනය හා පෞරුෂ සංවර්ධන වැඩමුළුව-සබරගමු පළාත | 80 | දින 01 | 8,400.00 | | දේශීය | |
| 09 | විශෝධන ක්‍රියාවලිය සඳහා සමාජ වැඩ විෂයෙහි ප්‍රායෝගික භාවිතය-උතුරුමැද පළාත | 43 | දින 02 | 42,550.00 | | දේශීය | |
| 10 | විශෝධන ක්‍රියාවලිය සඳහා සමාජ වැඩ විෂයෙහි ප්‍රායෝගික භාවිතය-මධ්‍යම පළාත | 68 | දින 02 | 119,640.00 | | දේශීය | ප්‍රජා විශෝධන ක්‍රියාවලිය සඳහා සමාජ වැඩ පිළිබඳව දැනුම වර්ධනය වීම |
| 11 | විශෝධන ක්‍රියාවලිය සඳහා සමාජ වැඩ විෂයෙහි ප්‍රායෝගික භාවිතය-ඌව පළාත | 66 | දින 02 | 127,250.00 | | දේශීය | |
| 12 | විෂයානුබද්ධ දැනුම සංවර්ධනය (පශ්චාත් උපාධි,ඩිප්ලෝමා,සහතිකපත්‍ර පාඨමාලා) | 17 | | 1,000,100.00 | | දේශීය | නිලධාරීන්ගේ විෂයානුබද්ධ දැනුම වර්ධනය වීම |
| **එකතුව** | | | | **1,421,650.00** | | | |

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය අනුකූල වේ/ අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අනුකූල නොවේ | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් නැත | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | ගබඩා අත්තිකාරම් ගිණුම් නැත | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | දීර්ඝ කාලීනව යාවත්කාලීන කර නොමැත | සියළු ස්ථාවර වත්කම් යළි ගණනය කර CIGAS පද්ධතියට එක් කිරීමට බලාපොරොත්තු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසීම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | යාවත්කාලීන කර ඇත | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | යාවත්කාලීන කරඇත | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | හානි පාඩු නොවීම මත යාවත්කාලීන නොවේ | |
| 2.10 | බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලන සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩ වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දීගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් නොමැත | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව විගණන සැලස්ම සකස් කිරීම | අනුකූල නොවේ | ආයතනයේ විගණන අංශයක් නොමැත.අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | ආයතනයේ විගණන අංශයක් නොමැත.අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | අභ්‍යන්තර විගණන අංශයක් නොමැත | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ | 2023 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුව පැවැත්වීමට කටයුතු කර ඇත |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | මේ වනවිට භාණ්ඩ සමීක්ෂණ අවසන් කර අදාළ වාර්තා විගණකාධිපති වෙත යවා ඇත | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | - | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 11.2 | මු.රෙ. 94(1)ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නො ඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | වැඩ තහනම් වූ නිලධාරියකුගේ විනය පරීක්ෂණය පැවැත්වෙන බැවින් | මේ වනවිට විනය පරීක්ෂණය පැවැත් වේ |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුතු වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂනය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුමක් නොමැත. | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නො කොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුමක් නොමැත. | |
| 15.3 | මු.රෙ.176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුමක් නොමැත. | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළු සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළු වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක/05 2008 හා 05/2018/(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රෙල්ඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චකුලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | මානව සම්පත් සැලැස්ම අනුව පුහුණු සැලැස්ම සකස් කර නොමැති අතර වාර්ෂික පුහුණු සැලැස්ම මගින් සියලුම නිලධාරීන් ආවරණයවේ. නමුත් ලබාදෙන ප්‍රතිපාදන සීමා සහිත බැවින් සියලුම නිලධාරීන්ට පුහුණුව ලබාදීමට නොහැකි වී ඇත. | |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |